# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2022.12.30 |


## ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය - 2021

### ජාතික සෞභාග්‍යය

2021 වසරේ දී ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය[1] 0.796ක අගයක් වාර්තා කළ අතර එය කොවිඩ්-19 වසංගතයේ බලපෑම තීව්‍ර වූ 2020 වසරේ වාර්තා කළ 0.764ක අගයට සාපේක්ෂව සුළු ඉහළ යෑමකි. මෙම ඉහළ යෑම සඳහා 'ආර්ථික සහ ව්‍යාපාර පරිසරය', 'ජන ජීවිතයේ යහපැවැත්ම' සහ 'සමාජ-ආර්ථික යටිතල පහසුකම්' යන උපදර්ශකයන් තුනෙහිම වර්ධනය දායක වී ඇත.

| | 2020 | 2021 |
|---|---|---|
| ***ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය*** | ***0.764*** | ***0.796*** |
| ***උපදර්ශක*** | | |
| ***ආර්ථික සහ ව්‍යාපාර පරිසරය*** | *0.799* | *0.825* |
| ***ජන ජීවිතයේ යහපැවැත්ම*** | *0.781* | *0.786* |
| ***සමාජ-ආර්ථික යටිතල පහසුකම්*** | *0.711* | *0.777* |

**රූප සටහන 1 - ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකයෙහි සහ එහි උපදර්ශකවල විචලනයන්: 2017 – 2021**




**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව**

**රූප සටහන 2 – සෞභාග්‍යතා දර්ශකය මගින් ආවරණය වන අංශ**




ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකයෙහි 2021 වසරේ ඉහළ යෑම සඳහා 2020 වසරට සාපේක්ෂව පවත්නා වෙළඳපොළ මිල අනුව ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) ඉහළ යෑම, සේවා නියුක්තිය, වැටුප් හා කර්මාන්ත ඝනත්වය යන නිර්ණායකයන් හි වැඩිදියුණු වීම හේතු විය. මේ අතර, පසුගිය වසරට සාපේක්ෂව 2021 වසරේ පැවති ඉහළ උද්ධමනය මෙම උපදර්ශකයෙහි වර්ධනය සඳහා අහිතකර ලෙස බලපාන ලදී.

ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකයේ සුළු ඉහළ යෑමට ප්‍රධාන ලෙස බලපා ඇති සාධක ලෙස අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම සහ මහජනතාවගේ වත්කම් 2020ට සාපේක්ෂව ඉහළ යෑම සැලකිය හැකිය. එසේ වුවද, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අඩු ඵලදායීතාවය, සෞඛ්‍ය නිලධාරීන්ගේ හිඟය වැනි නිර්ණායක මගින් නිරූපණය වෙන සෞඛ්‍ය පහසුකම්වල පහළ යෑම, පරිසරයේ පිරිසිදුකම අඩු වීම හා විනෝදාස්වාද කටයුතුවල නිරත වීම අඩු වීම මෙම උපදර්ශකයේ වර්ධනය අවම වීමට හේතු වී ඇත.


පොදු ප්‍රවාහනය භාවිතය අවම වීම, පිරිසිදු හා සෞඛ්‍යාරක්ෂිත ජලය සපයා ගැනීමේ හැකියාව අඩු වීම සහ වාර්තාගත අපරාධ සංඛ්‍යාව ඉහළ යෑම හේතුවෙන් සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකයේ ඇති වූ පහළ යෑම මගහැරවීමට විදුලිබල හා දුරකථන පහසුකම් වර්ධනය මෙන්ම මාර්ග පද්ධතියේ වැඩිදියුණු වීම දායක වී ඇත.

[1] ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය යනු රටෙහි සෞභාග්‍යය මැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරනු ලබන බහුමාන දර්ශකයකි. මෙම දර්ශකය, සෞභාග්‍යය මනිනු ලබන විවිධ අංශ නියෝජනය කරන විචල්‍යයන් 41 ක් යොදා ගනිමින් ගණනය කරනු ලබන ආර්ථික සහ ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජ-ආර්ථික යටිතල පහසුකම් යන උපදර්ශක තුනකින් සමන්විත වේ. ආර්ථික සහ සමාජීය යහපැවැත්ම තක්සේරු කිරීමේ ගෝලීය දර්ශකයක් වන Legatum සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කිරීමේ දී භාවිතා කරන ක්‍රමවේදයට සමාන ක්‍රමවේදයක් අනුගමනය කරමින් ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කිරීමේ ක්‍රමවේදය, 2020 වසර සඳහා වන දර්ශකය සම්පාදනයේ සිට සංශෝධනය කරන ලදී.

## පළාත්බද සෞභාග්‍යය

පළාත්බද සෞභාග්‍යතා දර්ශකයෙහි ඉහළම අගය තවදුරටත් බස්නාහිර පළාත වාර්තා කරන ලද අතර දකුණු සහ වයඹ පළාත් පිළිවෙළින් දෙවන සහ තෙවන ඉහළ අගයන් වාර්තා කරන ලදී. පෙර වසර හා සැසඳීමේ දී, සෞභාග්‍යතා දර්ශකයෙහි වැඩිම වර්ධනය වයඹ පළාතෙන් වාර්තා වූ අතර, ඉන් පසු දකුණු හා බස්නාහිර යන පළාත් අනුපිළිවෙලින් වර්ධනයන් වාර්තා කරන ලදී. මේ අතර, පළාත්බද සෞභාග්‍යතා දර්ශකයේ පසුබෑම් වාර්තා වී ඇත්තේ ඌව, සබරගමුව සහ උතුරු මැද පළාත් වලිනි.

**රූප සටහන 3 - පළාත්බද සෞභාග්‍යතා දර්ශක[2]: 2020- 2021**




**සංඛ්‍යා සටහන 1 - පළාත්බද සෞභාග්‍යතා දර්ශක සහ පළාත්බද ශ්‍රේණි**

| | දර්ශක අගය | | පළාත්බද ශ්‍රේණිය | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | 2020 | 2021 |
| මධ්‍යම | 0.556 | 0.559 | 3 | 4 |
| නැගෙනහිර | 0.519 | 0.519 | 7 | 7 |
| උතුරු මැද | 0.524 | 0.521 | 6 | 6 |
| වයඹ | 0.549 | 0.564 | 4 | 3 |
| උතුරු | 0.540 | 0.541 | 5 | 5 |
| සබරගමුව | 0.502 | 0.499 | 8 | 8 |
| දකුණු | 0.571 | 0.582 | 2 | 2 |
| ඌව | 0.476 | 0.468 | 9 | 9 |
| බස්නාහිර | 0.791 | 0.802 | 1 | 1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## පළාත්බද සෞභාග්‍යතා උපදර්ශකයන්හි කාර්ය සාධනය

### ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය

මෙම උපදර්ශකයේ වැඩිම වර්ධනය වයඹ පළාත වාර්තා කර ඇති අතර 2020 වසරට සාපේක්ෂව ඒක පුද්ගල පළාත්බද දළ දේශීය නිෂ්පාදිතයේ වැඩි වීම, රැකියා නියුක්තිය හා අවිධිමත් අංශයේ වැටුප් වැඩි වීම මේ සඳහා හේතු වී ඇත. 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියළුම පළාත් වලට බලපාන ලද විචලනශීලී හා ඉහළ උද්ධමනය මධ්‍යයේ වුවද සබරගමුව, බස්නාහිර සහ දකුණු පළාත් වල මෙම උපදර්ශකයේ වර්ධනයන් වාර්තා වී ඇත. අනෙකුත් පළාත් වල මෙම උපදර්ශකයේ පහළ යෑම සඳහා 2021 වසරේ දී රැකියා අංශයෙහි දක්නට ලැබුණු පසුබෑම බලපා ඇත.

### ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකය

සියලුම පළාත් මෙම උපදර්ශකයේ ඉහළ යෑම් වාර්තා කර ඇති අතර සෞඛ්‍ය පහසුකම් සැලසීම සඳහා වන වියදම් වැඩි වීම, අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීමේ වර්ධනය, සුපිරි වෙළඳසැල් ව්‍යාප්තිය ඉහළ යෑම සහ විශේෂයෙන් කොවිඩ්-19 වෛරසයෙන් ආරක්ෂා වීමට ගන්නා ලද පියවර නිසා ශ්වසන රෝග වාර්තාවීම් අඩු වීම මේ සඳහා හේතු වී ඇත. මෙම උපදර්ශකයේ වැඩිම වර්ධනය නැගෙනහිර පළාත මගින් වාර්තා කර ඇති අතර අඩුම වර්ධනය වාර්තා වී ඇත්තේ සබරගමුව පළාතෙනි.

### සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය

පළාත් හයක් තුළ මෙම උපදර්ශකයේ වර්ධනයන් දක්නට හැකි අතර බස්නාහිර පළාත එහි ඉහළම වර්ධනය වාර්තා කර ඇත. විදුලි හා දුරකථන පහසුකම් සහ මාර්ග පද්ධතියේ වැඩිදියුණු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මේ අතර, සබරගමුව, ඌව සහ උතුරු මැද පළාත් වල උපදර්ශකයේ පහළ යෑම් වලට හේතු වී ඇත්තේ පිරිසිදු පිරිසිදු හා සෞඛ්‍යාරක්ෂිත ජලය සපයා ගැනීමේ හැකියාව අඩු වීම මෙන්ම පොදු ප්‍රවාහන පහසුකම් භාවිතය සැලකිය යුතු ලෙස අඩු වීම වේ.

**සංඛ්‍යා සටහන 2 - පළාත්බද සෞභාග්‍යතා උපදර්ශක[2]**

| | 2020 | 2021 |
|---|---|---|
| **ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය** | | |
| මධ්‍යම | 0.576 | 0.565 |
| නැගෙනහිර | 0.579 | 0.548 |
| උතුරු මැද | 0.573 | 0.552 |
| වයඹ | 0.571 | 0.586 |
| උතුරු | 0.593 | 0.582 |
| සබරගමුව | 0.516 | 0.520 |
| දකුණු | 0.542 | 0.545 |
| ඌව | 0.515 | 0.499 |
| බස්නාහිර | 0.863 | 0.866 |
| **ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකය** | | |
| මධ්‍යම | 0.555 | 0.567 |
| නැගෙනහිර | 0.511 | 0.536 |
| උතුරු මැද | 0.545 | 0.558 |
| වයඹ | 0.571 | 0.580 |
| උතුරු | 0.586 | 0.587 |
| සබරගමුව | 0.526 | 0.527 |
| දකුණු | 0.604 | 0.619 |
| ඌව | 0.494 | 0.498 |
| බස්නාහිර | 0.734 | 0.742 |
| **සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය** | | |
| මධ්‍යම | 0.536 | 0.544 |
| නැගෙනහිර | 0.467 | 0.473 |
| උතුරු මැද | 0.455 | 0.452 |
| වයඹ | 0.506 | 0.525 |
| උතුරු | 0.439 | 0.455 |
| සබරගමුව | 0.464 | 0.449 |
| දකුණු | 0.567 | 0.583 |
| ඌව | 0.420 | 0.407 |
| බස්නාහිර | 0.775 | 0.798 |

[2]දර්ශක අගයන් සම්පාදනය කරනු ලබන්නේ පසුගිය වසර 15 තුළ වාර්තා වූ එහි ඉහළම සහ පහළම අගයන්ට අනුරූපව සෑම විචල්‍යයක්ම සාමාන්‍යකරණය කිරීමෙනි. සාමාන්‍යකරණය කළ විචල්‍යයකින් ගත හැකි ඉහළම සහ පහළම අගයන් පිළිවෙලින් 1 සහ 0 වේ. ඒ අනුව දර්ශක අගයන් ද 0 සහ 1 අතර පරාසයක විචලනය වේ. මෙමගින්, දර්ශකයෙහි අගය වැඩි වීමත් සමඟම, කාලයත් සමඟ සහ පළාත් එකිනෙක අතර එහි කාර්ය සාධනයන් සන්සන්දනය කිරීමේ හැකියාව ද සාපේක්ෂව වැඩි වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## තාක්ෂණික සටහන:

**සෞභාග්‍යතා දර්ශකය**

උපදර්ශක 3 ක් යටතේ වර්ගීකරණය කරන ලද විචල්‍යයන් 41 ක් යොදා ගනිමින් සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කරනු ලබන අතර ප්‍රධාන දර්ශකය තුළ සියලුම උපදර්ශක සඳහා සමාන බර තැබීම් ලබා දී තිබේ.

ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය මිල ස්ථායීතාව, ජීවන තත්ත්වය, ආදායම, දරිද්‍රතාවය, සේවා නියුක්තිය, කර්මාන්තශාලා ඝනත්වය සහ බැංකු ශාඛා ඝනත්වය ලෙස වර්ග කරනු ලැබූ විචල්‍යයන් 9 ක් භාවිතා කරමින් සම්පාදනය කරනු ලැබේ. ජන ජීවිතයේ යහපැවැත්ම පිළිබඳ උපදර්ශකය ගණනය කිරීමේ දී, සෞඛ්‍ය පහසුකම් පැවතීම, අධ්‍යාපන පහසුකම් පැවතීම හා එහි ගුණාත්මකභාවය, වත්කම්, විනෝද කටයුතු සඳහා වූ පහසුකම් පැවතීම හා එහි භාවිතය, වායුගෝලයේ ගුණාත්මකභාවය සහ පරිසරයේ පිරිසිදු බව යන අංශයන්ට අදාළව විචල්‍යයන් 22 ක් භාවිතා කරනු ලැබේ. සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය විචල්‍යයන් 10 කින් සමන්විත වන අතර, එමගින් ප්‍රවාහන පහසුකම් පැවතීම, මහා මාර්ග පහසුකම් පැවතීම, විදුලි සංදේශ පහසුකම් පැවතීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පහසුකම් පැවතීම, විදුලිබල පහසුකම් පැවතීම, ආරක්ෂිත පානීය ජල පහසුකම් පැවතීම හා එහි ගුණාත්මකභාවය, සහ සනීපාරක්ෂක පහසුකම් පැවතීම සහ අපරාධවලින් තොර පරිසරයක් පැවතීම, යන පැතිකඩ ආවරණය වේ.

**ක්‍රමවේදය**

ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනයේ දී යොදා ගන්නා විචල්‍යයන් විවිධ මිනුම් ඒකක මගින් ගණනය කරනු ලබයි. එම නිසා සියලුම විචල්‍යයන්ගේ පසුගිය වසර 15 ක දත්ත, සාමාන්‍යකරණය මගින් පොදු පරිමාණයකට සකසා ගනු ලැබේ. සමස්ත රටෙහි හා පළාත්වල දර්ශක වෙන් වෙන් වශයෙන් සම්පාදනය කර ඇති බැවින් පළාත්බද දර්ශක, ජාතික මට්ටමේ දර්ශක සමඟ සංසන්දනය කළ නොහැක. ඒ අනුව, පළාත්බද දර්ශක, පළාත් එකිනෙක අතර හා කාලය සමඟ සංසන්දනය කළ හැකි අතර ජාතික මට්ටමේ දර්ශක කාලය සමඟ පමණක් සංසන්දනය කළ හැක.

ආර්ථික සහ සමාජීය යහපැවැත්ම තක්සේරු කිරීමේ ගෝලීය දර්ශකයක් වන Legatum සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කිරීමේ දී භාවිතා කරන ක්‍රමවේදයට සමාන ක්‍රමවේදයක් අනුගමනය කරමින් ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කිරීමේ ක්‍රමවේදය, 2020 වසර සඳහා වන දර්ශකය සම්පාදනයේ සිට සංශෝධනය කරන ලදී. පසුගිය වසර 10 ට අදාළව එක් එක් විචල්‍යයන් සම්මතකරණය කිරීම වෙනුවට, විචල්‍යයන් සාමාන්‍යකරණය කිරීම මගින් පසුගිය වසර 15 තුළ වාර්තා වූ ඉහළම සහ පහළම අගයන් වලට අනුරූපව සෑම විචල්‍යකම හැසිරීම නිරීක්ෂණය වන අයුරින් (distance to frontier approach) මෙම සංශෝධනය සිදු කරන ලදී. එමගින්, දර්ශක පරාසය 0 සහ 1 අතර පවතින බැවින් දර්ශකය අර්ථකථනය කිරීම පහසු වන අතර, දර්ශකයේ ඉහළ අගයන් මඟින් සෞභාග්‍යතාවයේ වැඩිදියුණු වීම ද පහළ අගයන් මඟින් සෞභාග්‍යතාවයේ පසුබෑම ද නිරූපණය වේ.